# THE SRI LANKA COLLEGE OF ONCOLOGISTS

National Cancer Institute, Maharagama, Sri Lanka.

☎+94-11-2745474 | ✉info@slco.lk | www.slco.lk



**President**
Dr. Umagowry Saravanamuttu

**President-Elect:**
Dr. Sanath Wanigasooriya

**Vice President:**
Dr. Thushari Hapuarachichi

**Secretary**
Dr. Buddhika Somawardana

**Assistant Secretary:**
Dr. Devinda Jayathilake

**Treasurer**
Dr. Pradeep Siriwardane

**Assistant Treasurer:**
Dr. Iqbal Ahamad

**Co- Editors**
Dr. Sanjeeva Gunasekera
Dr. T Skandarajah

**Public Relations officer:**
Dr. Prabani Maddumarachchi

**Immediate Past President:**
Dr. Prasad Abeysinghe

**Past Presidents:**
Dr. N Jeyakumaran
Dr. A J Hilmi
Dr. Kanthi Perera
Dr. Dehan Gunasekera
Dr. Yasantha Ariyaratne

**Council Members:**
Dr. Lakshan Abeynaike
Dr. Mahalingam Chenthuran
Dr. Nuradh Joseph
Dr. Kavitha Indranath
Dr. Hasanthi Jayalath
Dr. Jaliya Jayasekera
Dr. Chintana Hapuarachchige
Dr. Mahendra Somathilaka
Dr. Sujeeva Weerasinghe
Dr. Mahilal Wijekoon
Dr.  Kusal de Silva
Dr. Wasantha Rathnayake
Dr. N Yoganathan
Dr. Sujeewa Siyambalapitiya
Dr. Sasikala Paramakulasingam
Dr. Roshan Gunarathne
Dr. Leela Siriwardhana


25th January 2025

**මාධ්‍ය නිවේදනය**

**ලෝක පිළිකා දිනය 2025: අනන්‍යතාවයන් තුළින් එකමුතුවීම (United by Unique) – වඩාත් සහනශීලී පිළිකා සත්කාරක සේවයක් ගොඩනැගනීම උදෙසා**

සෑම වසරකම පෙබරවාරි 4, ලෝක පිළිකා දිනය ලෙස සැළකේ. දිනෙන් දින ඉහළ යන ගෝලීය පිළිකා ව්‍යසනය හමුවේ පිළිකාව පිළිබඳ ජනතාව අතර දැනුවත් භාවය වැඩි කිරීම සඳහා සහ පිළිකාව මැඩලීම සඳහා වඩාත් අර්ථවත් ක්‍රියා මාර්ග ගෝලීය වශයෙන් සාමූහිකව ගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන පිළිකා මර්දනය පිළිබඳ ජාත්‍යන්තර එකමුතුව (The Union for International Cancer Control) විසින් ලෝක පිළිකා දිනය සැමරීමෙහිලා ප්‍රධානත්වය ගනු ලබයි. මේ වසරේ තේමා පාඨය වන **"වෙනස්කම් තුළින් එකමුතුවීම"** හරහා පිළිකා රෝගය පිළිබඳ වඩාත් මානුෂීය හා යතාර්ථවාදී පැතිකඩක් සාකච්ඡා කෙරේ. එනම්, පිළිකාව යනු හුදු රෝග විනිශ්චයකින් ඔබ්බට යන, එක් එක් රෝගියාගේ පුද්ගලික අත්දැකීම්, ඔවුන්ගේ එඩිතර බව, බලාපොරොත්තු සහගත බව සහ නොසැලෙන බව එකට කැටිවූ, එකිනෙකාට අනන්‍ය වූ ගමනක් බව අවබෝධ කර ගැනීම සහ ඊට සරිලන පරිදි එක් එක් රෝගියාගේ අවශ්‍යතා, පිළිකා සත්කාරය සමග බද්ධ කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීමයි.

ශ්‍රී ලංකාව තුළ බෝ නොවන රෝග නිසා ඇති වන මරණ වලට දෙවැනි සුලභතම හේතුව වන්නේ පිළිකා රෝගයයි. 2021 වසරේදී පමණක් අළුතින් වාර්තා වූ පිළිකා රෝගීන් සංඛ්‍යාව 37,753 කි. වඩාත් සරලව කිවහොත්, සෑම දිනකම දළ වශයෙන් අළුත් පිළිකා රෝගීන් 106ක් රට තුළ රෝග විනිශ්චයට ලක් වේ. එම වසර තුළ පමණක් දරුවන් 1000කට වඩා වැඩි සංඛ්‍යාවක් පිළිකා රෝගයට ගොදුරු වී තිබේ. ශ්‍රී ලංකාවේ කාන්තාවන් අතර වාර්තා වන සියළුම පිළිකා අතරින් 27.5%ක්ම පියයුරු පිළිකා වන අතර පිරිමින් අතර වඩාත් බහුලතම පිළිකා වන්නේ මුඛය, දිව සහ උගුර ආශ්‍රිත පිළිකා සහ පෙනහළු පිළිකාවන්ය. මෙම දත්ත තුළින් නැවත නැවතත් අවධාරණය වන්නේ වඩාත් සාර්ථක පිළිකා මර්දනය කිරීමේ ක්‍රියා මාර්ග සහ ප්‍රතිකාර සියළු රෝගී පුරවැසියන්ට සමානාත්මතාවයෙන්, ඔවුන්ට අනන්‍ය වූ අවශ්‍යතාවයන් පිළිබඳවද අවධානය යොමු කරමින් ලබා දීමේ කාලීන අවශ්‍යතාවයයි.

**ඉදිරි ගමන් මග: වැළැක්වීම, ප්‍රතිකාර සඳහා ළඟා වීමේ හැකියාව සහ සාධාරණ ලෙස බෙදී යාම විධිමත් කිරීම.**

පිළිකාව නිසා ඇතිවන පුද්ගල සහ සමාජමය බලපෑම අති විශාල වන අතර එය අවම කල හැක්කේ වඩාත් සක්‍රීයව ඉදිරිය ගැන සිතා ගනු ලබන එකිනෙකට බද්ධ වූ ක්‍රියාමාර්ග දාමයකින් පමණි. ශ්‍රී ලංකා පිළිකා විශේෂඥයන්ගේ විද්‍යායතනය මෙවැනි ක්‍රියා මාර්ගවල අවශ්‍යතාවය අවධාරණය කරයි:

**President**
Dr. Umagowry Saravanamuttu

**President-Elect:**
Dr. Sanath Wanigasooriya

**Vice President:**
Dr. Thushari Hapuarachichi

**Secretary**
Dr. Buddhika Somawardana

**Assistant Secretary:**
Dr. Devinda Jayathilake

**Treasurer**
Dr. Pradeep Siriwardane

**Assistant Treasurer:**
Dr. Iqbal Ahamad

**Co- Editors**
Dr. Sanjeeva Gunasekera
Dr. T Skandarajah

**Public Relations officer:**
Dr. Prabani Maddumarachchi

**Immediate Past President:**
Dr. Prasad Abeysinghe

**Past Presidents:**
Dr. N Jeyakumaran
Dr. A J Hilmi
Dr. Kanthi Perera
Dr. Dehan Gunasekera
Dr. Yasantha Ariyaratne

**Council Members:**
Dr. Lakshan Abeynaike
Dr. Mahalingam Chenthuran
Dr. Nuradh Joseph
Dr. Kavitha Indranath
Dr. Hasanthi Jayalath
Dr. Jaliya Jayasekera
Dr. Chintana Hapuarachchige
Dr. Mahendra Somathilaka
Dr. Sujeeva Weerasinghe
Dr. Mahilal Wijekoon
Dr. Kusal de Silva
Dr. Wasantha Rathnayake
Dr. N Yoganathan
Dr. Sujeewa Siyambalapitiya
Dr. Sasikala Paramakulasingam
Dr. Roshan Gunarathne
Dr. Leela Siriwardhana


- **වැළැක්වීම:** දුම්වැටි, මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය, සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර රටාවන්, ක්‍රියාශීලීත්වයෙන් අඩු ජීවන රටාවන් වැනි පිළිකාවට තුඩු දෙන සහ අපට වෙනස් කළ හැකි අවදානම් සාධක වලින් වැළකීම.
- **මුල් අවස්ථාවේදීම හඳුනා ගැනීම:** ජාතික වශයෙන් පිළිකා මුල් අවස්ථාවේදීම හඳුනා ගැනීමේ වැඩසටහන් පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම.
- **ප්‍රතිකාර සඳහා ලඟා වීමට ඇති හැකියාව:** කිසිඳු රෝගියෙකු, තම සමාජ ආර්ථික තත්වය හෝ ජීවත්වන ප්‍රදේශය පදනම් කරගෙන ඉක්මණින් ප්‍රතිකාර වෙත ළඟා වීමට ඇති නොහැකියාව සඳහා ඇති හේතු සාධක හඳුනා ගෙන වහා ඒවා සඳහා පිළියම් යෙදීම.

වසර ගණනාවක් පුරා ප්‍රමාද වූ, දිවයිනේ සියළු ප්‍රදේශ ආවරණය වන පරිදි නවීන විකිරණ ප්‍රතිකාර පුළුල් කිරීමේ ව්‍යාපෘතිය කඩිනම් කිරීම සඳහා රජය ගත් ක්‍රියාමාර්ග පැසසිය යුතුය. මේ වසර අවසානය වන විට මෙම නවීනතම ප්‍රතිකාර රටේ ප්‍රධානතම රෝහල් ගණනාවකට ලැබීමට නියමිතය. දැනට යල් පැන ගිය විකිරණ යන්ත්‍ර ඉවත් කිරීමේ සංකීර්ණ ක්‍රියාවලිය අදියර කිහිපයකින් සිදු වන අතර, නවීන යන්ත්‍ර සවි කර භාවිතයට ගන්නා තෙක් රෝගීන්ට විකිරණ ප්‍රතිකාර ලබා දීමේදී ඇති විය හැකි ප්‍රමාදයන් සහ අඩාල වීම් අවම කර ගැනීම සඳහා ගත යුතු කඩිනම් ක්‍රියා මාර්ග සම්බන්ධව ශ්‍රී ලංකා පිළිකා විශේෂඥයින්ගේ විද්‍යායතනය මේ වන විටත් රජය සමග යුහුසුළුව කටයුතු කරමින් සිටියි.

**වඩාත් සාර්ථක හෙට දිනයක් සඳහා එක්ව කටයුතු කරමු.**

අපගේ සාමාජිකයින් වන පිළිකා රෝග විශේෂඥ වෛද්‍යවරුන්, පිළිකා ශල්‍ය විශේෂඥ වෛද්‍යවරුන්, නාරිවේද විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුන්, ළමා හා නව යොවුන් පිළිකා රෝග විශේෂඥ වෛද්‍යවරුන් සහ රුධිරගත පිළිකා රෝග විශේෂඥ වෛද්‍යවරුන් ආදී සියළු දෙනා රෝගී ජනතාවට ලෝකයේ පිළිගත් ඉහළම ප්‍රතිකාර ලබා දීමට අප්‍රතිහතව කටයුතු කරයි. එනමුත්, ඔවුනට මෙහිලා මුහුණ පෑමට සිදුවන අභියෝග රාශියකි. ඇට මිදුළු බද්ධය වැනි වඩාත් සුවිශේෂී ප්‍රතිකාර, තිබෙන අවම පහසුකම් යටතේ රෝගීන්ට ලබා දීමට නොහැකි වීමෙන් තවමත් මෙවැනි ප්‍රතිකාර මඟින් සුව කළ හැකි රෝගීන් විශාල ප්‍රමාණයකට ඒ අවස්ථාව අහිමිව යයි. පිළිකා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය ලෙස අපි මෙවැනි ප්‍රතිකාර ලබා දීම සඳහා පිහිටවා ඇති ඒකක එකක් හෝ දෙකක් දිවයිනම ආවරණය වන පරිදි තෝරාගෙන නවීන පහසුකම් සහිතව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර සිටිමු. ඒ මඟින් මෙවැනි අසරණ රෝගීන් වෙනත් රටවල ඉතා මිල අධික ප්‍රතිකාරවලට යොමුවීම අවම කරගත හැකි වනු ඇත.

කීමොතෙරපි හෙවත් රසායනික ප්‍රතිකාර සඳහා අවශ්‍ය ඖෂධවල අඛණ්ඩ සැපයුම තවත් ඉතා වැදගත් කරුණකි. විශේෂයෙන්ම ආර්ථික අවපාතය හමුවේ අත්‍යාවශ්‍ය කීමොතෙරපි ඖෂධ වරින් වර හිඟ වීම නිසා රෝගීන්ගේ ප්‍රතිකාර නිසියාකාරව ලබා දීම අතිශයින් දුෂ්කර කාර්යයක් විය. මේ නිසා රජයේ ඉල්ලීම මත මෙවැනි ඖෂධ අත්‍යාවශ්‍යම ඒවාට පමණක් සීමා කිරීමට යෙදුණු නිසා, විශේෂයෙන්ම සුවකිරීමට අපහසු පිළිකා තත්වයන්ගෙන් පෙළෙන රෝගීන්ගේ ජීවිතවල ගුණාත්මක භාවය සැළකිය යුතු මට්ටමින් ඉහළ නැංවීමට හැකි ඇතැම් ඖෂධ මේ නිසා සීමා විය. නමුත් රට යථාවත් වෙමින්

# THE SRI LANKA COLLEGE OF ONCOLOGISTS


National Cancer Institute, Maharagama, Sri Lanka.

☎+94-11-2745474 | info@slco.lk | www.slco.lk



**President**
Dr. Umagowry Saravanamuttu

**President-Elect:**
Dr. Sanath Wanigasooriya

**Vice President:**
Dr. Thushari Hapuarachichi

**Secretary**
Dr. Buddhika Somawardana

**Assistant Secretary:**
Dr. Devinda Jayathilake

**Treasurer**
Dr. Pradeep Siriwardane

**Assistant Treasurer:**
Dr. Iqbal Ahamad

**Co- Editors**
Dr. Sanjeeva Gunasekera
Dr. T Skandarajah

**Public Relations officer:**
Dr. Prabani Maddumarachchi

**Immediate Past President:**
Dr. Prasad Abeysinghe

**Past Presidents:**
Dr. N Jeyakumaran
Dr. A J Hilmi
Dr. Kanthi Perera
Dr. Dehan Gunasekera
Dr. Yasantha Ariyaratne

**Council Members:**
Dr. Lakshan Abeynaike
Dr. Mahalingam Chenthuran
Dr. Nuradh Joseph
Dr. Kavitha Indranath
Dr. Hasanthi Jayalath
Dr. Jaliya Jayasekera
Dr. Chintana Hapuarachchige
Dr. Mahendra Somathilaka
Dr. Sujeeva Weerasinghe
Dr. Mahilal Wijekoon
Dr. Kusal de Silva
Dr. Wasantha Rathnayake
Dr. N Yoganathan
Dr. Sujeewa Siyambalapitiya
Dr. Sasikala Paramakulasingam
Dr. Roshan Gunarathne
Dr. Leela Siriwardhana


ආර්ථිකමය වශයෙන් වඩාත් ස්ථාවර වීමේදී මෙවැනි ඖෂධ සඳහාද රජයේ අවධානය යොමු වනු ඇතැයි අපි උදක්ම අපේක්ෂා කරමු.

**අප සියළු දෙනා එක්වීමෙන් පිළිකා ප්‍රතිකාර ලබාදීමේදී ඇති විෂමතාවයන් අවම කරගත හැකි බව අපි තරයේ විශ්වාස කරමු.**

වසරක් පාසා යෙදෙන ලෝක පිළිකා දිනය, මෙම මාරන්තික රෝගයෙන් අප රෝගීන් ගලවා ගැනීම සඳහා සියළු පාර්ශව සාමූහිකව පොදු අරමුණක් වෙනුවෙන් එක්ව කටයුතු කිරීමේ අප සතු පරම වගකීම නැවත නැවතත් අපට ඒත්තු ගන්වයි. ජනතාව දැනුවත් කිරීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, සෞඛ්‍ය යටිතල පහසුකම් නංවාලීම හා යාවත්කාලීන කිරීම ආදී සියළු ප්‍රයත්නයන් මේ සඳහා පිටිවහල් වනු ඇත. අප සියළු දෙනා මේ සඳහා එක්ව අත්වැල් බැඳගතහොත් ශ්‍රී ලංකාවාසී සියළු පිළිකා රෝගී පුරවැසියන්ට වඩාත් පහසුවෙන් තම නිවසට ආසන්න රෝහලකදී ගුණාත්මක බවින් උසස් ප්‍රතිකාර නොවළහා ලබා ගැනීමේ සිහිනය මල් ඵල ගැන්වෙන වඩාත් යහපත් හෙට දිනයක් උදා කර ගත හැකි වනු ඇතැයි අපි උදක්ම විශ්වාස කරමු.

මෙවර ලෝක පිළිකා දිනයේදී මෙම රෝගයන්ට ගොදුරුවන සුවහසක් ජනතාවගේ අප්‍රතිහත ධෛර්යය හා නොසැලෙන ගුණය සිහිපත් කරමින් ඔවුනට දිරි දීමටත්, පිළිකාව වැළැක්වීමට සහ ඒ පිළිබඳ දැනුවත් භාවය නැංවීම සඳහා ඔබ නඟන හඬ තීව්‍ර කිරීමටත්, පිළිකාවට ගොදුරුවූවෙකු රෝගියෙකු ලෙස පමණක් නොව ඉන් ඔබ්බට ගොස් පුළුල් හා මානුෂීය ලෙස ඔවුනොවුන්ට අනන්‍ය වූ ගැටළු සහ සාධක හඳුනා ගනිමින් ඔවුන් දෙස බැලීමටත් අදිටන් කර ගනිමු.

ස්තූතියි!

Umagowry. S.

……………………………………… 

**සභාපති**
වෛද්‍ය උමාගෞරී සරවනමුත්තු,
පිළිකා රෝග විශේෂඥ වෛද්‍ය,
ශ්‍රී ලංකා ජාතික පිළිකායතනය, මහරගම

President
The Sri Lanka College of Oncologists
National Cancer Institute - Maharagama
Sri Lanka

……………………………………… 

**ලේකඛාධිකාරී**
වෛද්‍ය බුද්ධික සෝමවර්ධන,
රුධිරගත පිළිකා රෝග විශේෂඥ වෛද්‍ය
ශ්‍රී ලංකා ජාතික පිළිකායතනය, මහරගම

Secretary
The Sri Lanka College of Oncologists
National Cancer Institute - Maharagama
Sri Lanka

**වැඩි විස්තර සඳහා සම්බන්ධ වන්න:**

**නම :** විශේෂඥ වෛද්‍ය බුද්ධික සෝමවර්ධන
**දූරකථන:** 0760830979
**ඊමේල්:** info@slco.lk
**වෙබ් අඩවිය:** https://slco.lk/